සියලුම හිමිකම් ඇවිරිණි.


දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Southern Provincial Department of Education**

අ. පො. ස. (උසස් පෙළ) - තෙවන වාර පරීක්ෂණය - 2021
**G. C. E. (Adv. Level) - Second Term Test - 2021**

| | | | |
|---|---|---|---|
| **බෞද්ධ ශිෂ්ටාචාරය - I**<br>**Buddhist Civilization - I** | **45 S I** | 13 ශ්‍රේණිය | කාලය පැය 02 යි.<br>**Two hours** |


උපදෙස්:-
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (×) කතිරයක් යොදා දක්වන්න.

(1) භාරතීය සමාජයේ බමුණු ආධිපත්‍යය ගොඩනගා ගැනීම සඳහා ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් බොහෝ සෙයින් ඉවහල් විය. ඒ අනුව ජන්මයෙන්ම පුද්ගලයාට කළයුතු වූ කාර්ය භාරයන් හඳුන්වා දුන්නේ,
1. වර්ණ ධර්ම තුළිනි
2. ස්ව ධර්ම තුළිනි
3. ආපද්ධර්ම තුළිනි
4. ආශ්‍රම ධර්ම තුළිනි
5. උපනයනය තුළිනි

(2) සමාජ ප්‍රභවය පිළිබඳව කරුණු දක්වන බෞද්ධ මූලාශ්‍ර අනුව එය සිදු වී ඇත්තේ හේතුඵලවාදීවය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ නිරත වූ පිරිස් හඳුන්වන ලද්දේ,
1. බ්‍රාහ්මණ නමිනි
2. ක්ෂත්‍රිය නමිනි
3. වෛශ්‍ය නමිනි
4. ශූද්‍ර නමිනි
5. සිටුවරු නමිනි

(3) ආශ්‍රම ධර්ම පිළිබඳව බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව "වාන ප්‍රස්ථ" ආශ්‍රමයේ දී කළ යුතු වූ ප්‍රධාන කාර්යය වූයේ,
1. ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමයි
2. මෝක්ෂය පතමින් යෝගී භාවනාවල නිරත වීමයි.
3. වනගත වී තවුස්දම් රැකීමයි.
4. විවාහ වී අඹුදරුවන් පෝෂණය කිරීමයි.
5. යුතුකම් ඉටුකරමින් සමාජයේ ජීවත් වීමයි.

(4) බුද්ධ කාලීන භාරතයේ විවිධ ශ්‍රමණ කණ්ඩායම් සිටි බව සඳහන් වේ. ඒ අතර ගිනිදෙවියන් පිදීමට හා උදක පාරිශුද්ධත්වයට ප්‍රමුඛත්වය ලබාදුන් පිරිසක් ලෙස ප්‍රකට වන්නේ,
1. නිගණ්ඨයෝ ය
2. ආජීවකයෝ ය
3. ජටිලයෝ ය
4. පරිබ්‍රාජකයෝ ය
5. බ්‍රාහ්මණයෝ ය

(5) ක්‍රි. පූ. 8 වන සියවසේ පෞරව රාජ්‍යයේ බිඳවැටීමත්, අග නගර මාරුවීමත්, ප්‍රාදේශීය රජවරු කුඩා කුඩා රාජ්‍ය පිහිටුවා ගැනීමත් නිසා සොළොස් මහා ජනපද බිහිවූ බව සඳහන් වේ. එම සොළොස් මහා ජනපද පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ,
1. සොළොස් මහා ජනපද අතර ප්‍රබල රාජාණ්ඩු හතරක් විය.
2. මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කිරීම සමූහාණ්ඩු පාලනයේ ලක්ෂණයක් විය.
3. අග නගරය සාවත්ථිය වූ කෝසල රාජ්‍යයට බරණැස හා සාකේතය ද ඇතුළත් විය.
4. වත්ස රාජ්‍යයේ අගනුවර වූයේ කොසඹෑ නුවරයි.
5. අනුපිය අඹවනයත්, උපවත්තන සල්උයනත් පිහිටා තිබුණේ මල්ල රාජ්‍යයේ ය.

(6) සත්ත්වයාගේ කෙලෙසීම හා පිරිසිදුවීම හේතු ප්‍රත්‍ය රහිතව සිදුවන බව ප්‍රකාශ කළ බුද්ධ කාලීන ශාස්තෘවරයා වූයේ,
1. නිගණ්ඨ නාතපුත්ත තුමා ය
2. මක්ඛලී ගෝසාල තුමා ය
3. පූර්ණ කස්සප තුමා ය
4. අජිත කේසකම්බල තුමා ය
5. පකුධ කච්චායන තුමා ය

(7) නිගණ්ඨ නාතපුත්ත ශාස්තෘවරයා කර්ම සංකල්පය විශේෂයෙන් අගය කළ අතර එතුමාගේ කර්ම විග්‍රහයට අනුව කර්මය කොටස් අටකට බෙදා දක්වා ඇත. එහි "මෝහනීය කර්ම" ලෙස දක්වා ඇත්තේ,
1. ආත්මය කිළිටි කරන කර්මයි
2. දුක ඇතිකරන කර්ම යි
3. ආයුෂ ඇති කරන කර්ම යි
4. පුද්ගලයා දියුණු කරවන කර්ම යි
5. පුද්ගල අවයව ඇතිකරන කර්ම යි

(8) "තුන්ලොව තතු ලෙස ම
දැනගෙන නොදත් මෙලොවට
දෙසුයෙන් නියම කොට
................ .................... ................
යනාදී පද්‍යයෙන් විස්තරවන බුදුගුණය කුමක් ද?
1. සත්ථා 2. අරහං 3. බුද්ධ
4. සුගත 5. ලෝකවිදූ

(9) බුදුරජාණන් වහන්සේගේ සෙසු ගුණාංගවලට වඩා ................................ ශ්‍රේෂ්ඨ යැයි උන්වහන්සේ විසින් ම දේශනා කරන ලද බව මහා සකුළුදායී සූත්‍රයෙන් ප්‍රකට කරයි.
1. මහා කරුණාව 2. මහා ප්‍රඥාව 3. ශාස්තෘත්වය
4. නායකත්වය 5. ඉවසීම

(10) **"නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි"**
ඉහත ප්‍රකාශය සිදුකරන ලද්දේ,
1. බර්ට්‍රන්ඩ් රසල් ය 2. මහාචාර්ය සෝණ්ඩර්ස් ය 3. මහාචාර්ය ලක්ෂ්මී නරසු ය
4. එඩ්වින් අර්නෝල්ඩ් ය 5. ඇල්බට් අයින්ස්ටයින් ය

(11) පහත සඳහන් ප්‍රකාශ අතර වැරදි ප්‍රකාශ කිහිපයක් ඇත.
A. විශාඛා මහෝපාසිකාව සොළොස් වසරක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්ම චර්යාව ආරක්ෂා කළාය.
B. ඛේමා තෙරණිය සෝවාන් ඵලයට පත්වූයේ මහා නිදාන සූත්‍රය ඇසීමෙනි.
C. චිත්ත ගෘහපතිතුමා අනාගාමී උපාසකතුමෙක් විය.
D. ආනන්ද තෙරුන් වහන්සේ වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙන් රහත් ඵලය ලැබූහ.
E. අනේපිඬු උපාසකතුමා දන්දීමේ ඇලුණු උපාසකවරු අතර අග තනතුර ලැබුවේ ය.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදිම ප්‍රකාශ තුනක් ඇතුළත් වරණය තෝරන්න.
1. A, B, සහ C 2. B, C, සහ D 3. C, D, සහ E
4. A, C, සහ E 5. B, C, සහ E

(12) පුද්ගල ස්වච්ඡන්දතාවයට, ස්වාමිත්වයට, ස්වාධීනත්වයට හා වගකීමට බාධා නොවන ඉගැන්වීමක් වන්නේ,
1. පුබ්බේකත හේතුවාදය යි 2. ඊශ්වර නිර්මාණවාදය යි 3. හේතුඵලවාදය යි
4. නියතිවාදය යි 5. අහේතු අප්පච්චය වාදය යි

(13) පැරණි භාරතීය වැසියන් කෘෂිආර්ථිකයට මුල් තැනක් ලබාදුන් අතර වෙළඳ ආර්ථිකයට ද යොමුවිය. වාණිජකරණය ක්‍රමයෙන් දියුණු වූ බවට බොහෝ සාධක ඇත. ඒ අතරින් ඉතා දියුණු තත්ත්වයකට වාණිජකරණය පත්වූ බවට හොඳම නිදසුනක් වන්නේ,
1. සිටුවරු බිහිවීමයි
2. භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමයි
3. නගරයෙන් නගරයට භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි
4. විවිධ වරායන් ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි
5. පදික වෙළඳාම පැවතීමයි

(14) නකුලමාතා හා නකුලපිතා ගත කළ යුග දිවිය බුදුරදුන්ගේ ද පැසසුමට ලක්විය. එසේවීමට ඔවුන් දෙදෙනා තුළ සුවිශේෂී ගුණධර්ම හතරක් සමානව පැවතියේ ය සමජීවී සූත්‍රයේ ද සඳහන් එම ගුණධර්ම හතර වන්නේ,
1. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප 2. සද්ධා, සීල, චාග, පඤ්ඤා 3. සද්ධා, විරිය, සීල, පඤ්ඤා
4. සද්ධා, සති, සමාධි, පඤ්ඤා 5. සද්ධා, සීල, සති, සමාධි

(15) කෘෂිකර්මාන්තය ද දැහැමි ජීවනෝපායක් ලෙස බුදුදහමින් අගය කර ඇත. ඒ නිසාම කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජ්‍ය අනුග්‍රහය ලබාදිය යුතු බවද සඳහන් කරයි. එම උපදෙස් ලබාදෙන බෞද්ධ සූත්‍ර දේශනාවක් වන්නේ,
1. අග්ගඤ්ඤ සූත්‍රය යි 2. කසී භාරද්වාජ සූත්‍රය යි 3. මහා පරිනිබ්බාන සූත්‍රය යි
4. කුට දන්ත සූත්‍රය යි 5. රජ්ජ සූත්‍රය යි.

(16) බෞද්ධ දේශපාලන දර්ශනය අනුව ක්‍රියාකරන පාලකයා සමාජ සුභසාධනය හා ජනතා සුභසිද්ධිය සඳහා ම කැපවිය යුතුය. කාලය, ධනය, ශ්‍රමය ජනතාව වෙනුවෙන් කැපකළ යුතුය. අගතිගාමී නොවී හිතට එකඟව ක්‍රියා කිරීමත් ඉන්ද්‍රිය දමනයත් ඇති පුද්ගලයාට බෞද්ධ පාලන ප්‍රතිපත්ති අනුගමනය කළ හැකිය.

ඉහත ප්‍රකාශය තුළ ඇතුළත් දසරාජ ධර්මවලට අයත් ගුණ ධර්ම සංඛ්‍යාව
1. දෙකකි 2. තුනකි 3. හතරකි 4. පහකි 5. හයකි

(17) බුද්ධ කාලීන භාරතයේ පැවති සොළොස් මහා ජනපද අතර ගණතන්ත්‍ර පාලන ක්‍රමය ක්‍රියාත්මක වූ ප්‍රධාන ජනපද දෙකක් ලෙස හඳුනාගත හැක්කේ,
1. කෝසල හා මල්ල රාජ්‍යයන් ය 2. මල්ල හා අවන්ති රාජ්‍යයන් ය 3. අවන්ති හා වජ්ජි රාජ්‍යයන් ය
4. වජ්ජි හා මල්ල රාජ්‍යයන් ය 5. මල්ල හා කාසි රාජ්‍යයන් ය

(18) පසුගිය දිනක මහාසේනපුර මහා විද්‍යාලයේ සිසුන්ට අනුශාසනාවක් කළ එම විද්‍යාලයේ ගරු ස්වාමීන් වහන්සේ "යහපත් අනාගත සමාජයක් බිහිකිරීම සඳහා සැමදෙනාම තමන් වරදින් වැළකී, අනුන් ද වරදින් වළක්වා, අනුන් කරන වරදට අනුබලනොදී ක්‍රියා කිරීමේ වැදගත්කම පැහැදිලි කළහ."

ඉහත ප්‍රකාශය අනුව ගම්‍ය වන බෞද්ධ සදාචාර මූලධර්මය වන්නේ,

1. විරතිය හා සමාදානය යි
2. ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය යි
3. පංචසීල ප්‍රතිපත්තිය යි
4. ත්‍රිවිධ අධිපති ධර්මය යි
5. අධි සීලය යි

(19) දිනෙන් දින සංවර්ධනය වන දළදාගම බෞද්ධ සංගමයේ සභාපතිවන බෝධිරත්න මහතා සෑම පසළොස්වක පොහෝ දිනකම අටසිල් සමාදන් වී මැනවින් සිල් ආරක්ෂා කරන්නෙකි. භික්ෂූන් වහන්සේලාට පිරිසිදු සිතින් දන් පිළිගන්වන ඔහු වසරකට වරක් ගම්වැසියන්ගේ ද සහයෝගය මත දන්සලක් පැවැත්වීම ඔහුගේ ජනප්‍රියත්වයට ද හේතුවකි. තෙරුවන් උදෙසා පමණක් නොව මව්පියන් වැඩිහිටියන්, රෝගීන් සඳහා ද ඉටුවිය යුතු යුතුකම් ඉටුකරන ඔහු විහාරස්ථානයේ පවිත්‍රතා ද සිදුකරයි. වැරදි ආකල්ප වලින් තොරව නිවැරදි අදහස් ආකල්ප වලින් යුතුව ක්‍රියාකිරීම ද ඔහු සතු ගුණාංගයකි.

මේ ප්‍රකාශය අනුව බෝධිරත්න මහතා තුළ පවතින දස පින් කිරියවත්වලට අදාළ ගුණ ධර්ම ගණන,

1. දෙකකි
2. තුනකි
3. හතරකි
4. පහකි
5. හයකි

(20) රටක් තුළ ඇතිවන අපරාධ මර්දනය කිරීම පාලකයාගේ වගකීමකි. අධාර්මික ක්‍රියාවන් තුළින් අපරාධ බහුල වෙයි. මේ ගැන අවබෝධයෙන් කටයුතු කිරීමට පාලකයාට උපදෙස් දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය වන්නේ,

1. දස සක්විතිවත යි
2. පඤ්ච සීල ප්‍රතිපත්තිය යි
3. ලෝක පාලක ධර්මය යි
4. දසරාජ ධර්මය යි
5. සතර සංග්‍රහ වස්තුව යි

(21) නීතිගරුක සමාජයක් බිහිකිරීමේ දී ජන සම්මතවාදී පාලන ක්‍රමය ඉතා වැදගත් ය. එසේම රටක පවතින සාම්ප්‍රදායික ලක්ෂණ බැහැර නොකර ඒවා රැක ගැනීම ද එවැනි පාලන ක්‍රමයක ලක්ෂණයකි. ඒ සඳහා මඟ පෙන්වන බෞද්ධ දේශපාලන සිද්ධාන්තයක් ඇතුළත් වන්නේ,

1. අග්ගඤ්ඤ සූත්‍රයේ ය
2. කූටදන්ත සූත්‍රයේ ය
3. මහා පරිනිබ්බාණ සූත්‍රයේ ය
4. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය
5. සාමඤ්ඤඵල සූත්‍රයේ ය

(22) බුදු සමය දඬුවම ප්‍රතික්ෂේප නොකරයි. එහෙත් අපරාධ මැඩපවත්වා රටක් සංවර්ධනය කිරීම දඬුවම් දීමෙන් පමණක් කළ නොහැකි බව බුදුසමය අවධාරණය කරයි. පුද්ගලයා අපරාධ වලට පොළඹවන හේතු සොයා බලා ඒවාට විසඳුම් දීම තුළින් යහපත් අරමුණු සඵල කරගත හැකිය. බෞද්ධ මතයට අනුව මිනිසා විවිධ අපරාධවලට යොමුවීමට බලපාන හේතු අතර ප්‍රධාන හේතුවක් ලෙස පෙන්නුම් කරන්නේ,

1. දිළිඳුකමයි
2. මහිච්ඡතාවය යි
3. අල්පේච්ඡතාවය යි
4. අධ්‍යාපනය යි
5. ධනවත් බව යි

(23) පහත සඳහන් ප්‍රකාශ අතර වැරදි මෙන්ම නිවැරදි ඒවා ද ඇත.

A. ලෝක පාලක ධර්ම නම් හිරිඔත්තප්ප දෙකයි.
B. හිරි ඔත්තප්ප දෙක සප්තාර්ය ධනය තුළද ඇතුළත් ය.
C. මෝහ අගතිය සප්තාර්ය ධනයට ඇතුළත් ය.
D. සතර සංග්‍රහ වස්තුවෙහි දානය නම් ප්‍රජා සුභ සාධනයයි.
E. අර්ථ චර්යාව නම් තමාගේ දියුණුව පතා ක්‍රියාකිරීමයි.

ඉහත ප්‍රකාශ අනුව කරුණු තුනක් ම නිවැරදිව ඇති පිළිතුර තෝරන්න.

1. A, B, සහ C
2. C, D, සහ E
3. B, C, සහ D
4. A, C, සහ E
5. A, B, සහ D

(24) බුදුරජාණන් වහන්සේ තුළ පැවති ප්‍රසන්න බව විස්තර කරමින් දේශනා කළ සූත්‍ර දේශනාව දීඝනිකායේ සම්පසාදනීය සූත්‍රය යි. එය දේශනා කළේ,

1. බුදුරජාණන් වහන්සේ විසිනි
2. ආනන්ද තෙරුන් වහන්සේ විසිනි
3. සැරියුත් තෙරුන් වහන්සේ විසිනි
4. මුගලන් තෙරුන් වහන්සේ විසිනි
5. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ විසිනි

(25) බෞද්ධ භික්ෂුණී ශාසනය තුළ ප්‍රඥාවන්ත භික්ෂුණීන් වහන්සේ ලෙස ගෞරවයට පත්වූයේ,

1. ඛේමා රහත් මෙහෙණින් වහන්සේ ය
2. උප්පලවණ්ණා රහත් මෙහෙණින් වහන්සේ ය
3. ධම්ම දින්නා රහත් මෙහෙණින් වහන්සේ ය
4. පටාචාරා රහත් මෙහෙණින් වහන්සේ ය
5. සකුලා රහත් මෙහෙණින් වහන්සේ ය.

(26) කුසල අකුසල ක්‍රියාවන් තීරණය කිරීමෙහි ලා චේතනාව හා විපාකය පාදක කරගත හැකි බව ද බෞද්ධ අදහස යි. ඒ බව මතුකර දක්වන ධම්ම පද ගාථාවක් වන්නේ,

1. මනෝ පුබ්බංගමා ධම්මා ............. යනාදී ගාථාව යි
2. අසාරේ සාරමතිනෝ ......... යනාදී ගාථාව යි
3. උට්ඨානවතෝ සතිමතෝ ........... යනාදී ගාථාව යි
4. නභජේ පාපකේ මිත්තේ ...... යනාදී ගාථාව යි
5. නහි වේරේන වේරානී ........ යනාදී ගාථාව යි

(27) හොඳ නරක ක්‍රියා විනිශ්චය කිරීමෙහි ලා විවිධ ආගම්වල විවිධ මිනුම් දඬු යොදාගනු ලැබේ. එක් ආගමක උගන්වන යහපත් ක්‍රියාවක් තවත් ආගමක අයහපත් ක්‍රියාවක් ලෙස දැක්විය හැකිය. එසේ වුවත් හොඳ නරක ක්‍රියා තීරණය කිරීමෙහි ලා බෞද්ධ නිර්ණායක ලෝකයේ යථාර්ථයට අනුරූප වේ. මේ අනුව පව් කළ තැනැත්තා, ඔහු විසින් කරන ලද ක්‍රියාව පිළිබඳව හෘද සාක්ෂිය අනුව එය මැනවින් දනී.

මෙම ප්‍රකාශයට අනුව හොඳ නරක විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායකය වන්නේ,
1. ඕනෑම ආගමක සම්මත යහපත් දේ කිරීමයි
2. තම හෘද සාක්ෂියට අනුව ක්‍රියා කිරීමයි
3. සිද්ධියට අදාළ වූ ක්‍රියා පමණක් සිදුකිරීමයි
4. නුවණ ඇති අයගෙන් විමසා හොඳ නරක තීරණය කිරීමයි
5. තම අභිවෘද්ධියට හේතු නොවුනද පරාර්ථය පිණිස හේතුවේ නම් එම ක්‍රියාව සිදුකිරීමයි

(28) චේතනාවක් සහිතව කරනු ලබන හොඳ නරක ක්‍රියාවන්ගේ විපාකය එම ක්‍රියාව සිදුකළ තැනැත්තාටම පැවරීමට නම් ඒ පිළිබඳව ඔහුට,
1. විශ්වාසයක් තිබිය යුතුය
2. ස්වච්ඡන්දතාවයක් තිබිය යුතුය
3. වගකීමක් තිබිය යුතුය
4. චේතනාවක් තිබිය යුතුය
5. විචිකිච්ඡාවක් තිබිය යුතුය

(29) පන්සිල්, අටසිල්, දසසිල්, දසපින් කිරියවත් යනාදී ලෙස බෞද්ධයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම සමූහයක් බුදු දහමෙහි උගන්වා ඇත. මෙම කරුණුවලට අනුව බෞද්ධයන් සදාචාර විරෝධී ක්‍රියා නොකළ යුතුය. සදාචාර ක්‍රියාවල යෙදීම වැදගත් වේ. මෙය සමාදාන හා විරතිය යනුවෙන් හැඳින්වේ. විරති ගණයට ගැනෙන "අභිජ්ඣාවෙන් වැළකීම" යන සදාචාරාත්මක මානසික ක්‍රියාව ඇතුළත් වන්නේ,
1. දස කුසලය තුළය
2. අෂ්ටාංග සීලය තුළය
3. දස සීලය තුළය
4. දස පුණ්‍ය ක්‍රියා තුළය
5. පංච සීලය තුළය

(30) සතර සංග්‍රහ වස්තුවට අනුව කටයුතු කිරීම යහපත් සමාජයක පැවතිය යුතු වටිනා චර්යා ධර්ම සමූහයකි. එය උදාහරණයකින් ගත් කළ "ගමන් කරන්නා වූ රථයකට කඩ ඇණයකින් ලබන පිටුවහලක් මෙනි" සිගාලෝවාද සූත්‍රයේ දී මෙම කරුණු යුතුකම් ලෙස පවරා ඇත්තේ,
1. ගුරුවරුන්ට ය
2. කුල පුත්‍රයන්ට ය
3. පැවිදි පක්ෂය වෙත ය
4. දෙමව්පියන් හට ය
5. මිත්‍ර සමූහයාට ය

(31) "ආකාරවතී" යන පාරිභාෂික වචනයෙන් ශ්‍රද්ධාව හඳුන්වනු ලබන්නේ,
1. භක්තිමත් බව පැහැදිලි කිරීමට යි
2. දැඩිව ග්‍රහණය කළ යුතු බව පැහැදිලි කිරීමට යි
3. අවබෝධයෙන් යුතුව පැහැදීම යන්න පැහැදිලි කිරීමට යි
4. නිරවද්‍යතාවය විස්තර කිරීමට යි
5. "උතුරායන ශ්‍රද්ධාව" යන්න පැහැදිලි කිරීමට යි

(32) දැහැමිවූත්, ශිෂ්ට සම්පන්න වූත්, මානසික තෘප්තිය උතුම් ධනයක් ලෙස බුදු සමය අවධාරණය කරන්නේ................ යනුවෙනි.
1. සන්තුට්ඨී පරමං ධනං
2. විස්වාසාපරමා ඤාතී
3. සන්ති ලක්ඛනං නිබ්බාණං
4. විනායෝ නාම සාසනස්ස ආයු
5. ආරෝග්‍යා පරමාලාභා

(33) පරිසරය හා බුදුසමය අතර පවත්නා සමීප සබඳතාවත්, පරිසර සංරක්ෂණය පිළිබඳව බුදුදහමේ අවධානයත්, විනය පිටකයේ සහ සූත්‍ර පිටකයේ ද දක්නට ලැබේ. රුක් රෝපණය, උද්‍යාන නිර්මාණය, ඒ දඬු පාලම් ඉදිකිරීම ආදිය නිතර පිං වැඩෙන පිංකම් ලෙස සඳහන් කර ඇත්තේ,
1. වනරෝප සූත්‍රයේ ය
2. අරිය පර්යේසන සූත්‍රයේ ය
3. මෙත්ත සූත්‍රයේ ය
4. මහා පරිනිබ්බාණ සූත්‍රයේ ය
5. සච්ච විභංග සූත්‍රයේ ය

(34) බුදුරජාණන් වහන්සේ හා වීතරාගී භික්ෂු, භික්ෂුණීන් සෞන්දර්ය වින්දනය කළ අයුරු බෞද්ධ මූලාශ්‍රවල දක්නට ලැබේ. සෞන්දර්ය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව මෙය,
1. උපාදානාත්මක වින්දනය යි
2. සෞන්දර්යාත්මක වින්දනය යි
3. අනුපාදානාත්මක වින්දනය යි
4. ශෘංගාරාත්මක වින්දනය යි
5. සුඛවේදනාත්මක වින්දනය යි

(35) දැහැමි විවේකය හා පරිසර හිතකාමී බව මිනිසාගේ දියුණුවට අත්‍යවශ්‍ය සාධකයක් බව බුදුසමය පිළිගනී. ඒ සඳහා උපයෝගීවන්නේ බෞද්ධ කලා රසාස්වාදය යි. අතීතයේ සිටම බෞද්ධයා, පෙරහැර, වෙසක් තොරණ, පහන් කූඩු හා සැදැහැති ගී තුළින් සැනසුම්දායක කායික හා මානසික විවේකය ලැබූහ. මෙමඟින් පැහැදිලි වන්නේ,
1. විවේකය හා ධාර්මික ප්‍රීති සුවය, බුදුසමය තුළ අවතක්සේරු කර නොමැති බවයි.
2. ගෘහස්ථ බැඳීම්වලින් ඈත්විය යුතු බවයි.
3. නිරන්තරයෙන් පෙරහැර, වෙසක් කූඩු, තොරණ ආදිය නැරඹිය යුතු බවයි.
4. ස්වාභාවික සෞන්දර්ය හා නිර්මාණ අගය කළ යුතු බවයි.
5. බෞද්ධයා සෑම විටම විවේකයෙන් කටයුතු කළ බවයි.

(36) උත්සාහයෙන් ශ්‍රම ශක්තිය යොදා ධන සම්පත් සොයාගන්නා පුද්ගලයා එකී ධන සම්පත් නිසිසේ පරිභෝජනය කළ යුතුය. ඒ සඳහා බුදුසමය පරිභෝජන දර්ශනයක් ඉදිරිපත් කරයි. ගැඹුරු අවබෝධයකින් යුතුව කරනු ලබන එම පරිභෝජන දර්ශනය නම්,
1. ධාර්මිකව ධනය පරිභෝජනය කිරීමයි
2. ආපදාවක දී ගැනීම සඳහා තැන්පත් කර පරිභෝජනය කිරීමයි
3. මුලානොවී පරිභෝජනය කිරීමයි
4. තමන් හා අනුන් යන දෙපිරිසම පරිභෝජනය කිරීමයි
5. ආයෝජනය සඳහා වැඩි කොටසක් යොදා ගැනීමයි

(37) කිසියම් සංවිධානයක හෝ පුද්ගලයෙකුගේ හෝ ඵලදායිතාවය වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් ලෙස කළමනාකරණය හැඳින්විය හැකිය. මෙම අරුතින් බෞද්ධ ඉගැන්වීම් තුළ කළමනාකරණය අර්ථ දැක්වෙයි. භෞතික හා මානව සම්පත් කළමනාකරණයේ දී ගිහිපැවිදි දෙපක්ෂයටම මූලික පරමාර්ථ සාධනයෙහි ලා ප්‍රමුඛ වූ කළමනාකාරිත්වයක් ලෙස අවධාරණය කර ඇත්තේ,
1. ආධ්‍යාත්මික කළමනාකරණය යි 2. සම්පත් කළමනාකරණය යි 3. කාල කළමනාකරණය යි
4. නිෂ්පාදන කළමනාකරණය යි 5. පිරිස් කළමනාකරණය යි

(38) බුදුසමය සැපය පිළිබඳව නිරතුරුව අවධානය යොමුකර ඇත. මිනිසා සුඛකාමී සත්ත්වයකු ලෙස පිළිගෙන ඇත. සසර දුක් සහිත වුවද විවිධ සැප පිළිබඳව සඳහන් කරනු ලබයි. ඒ අතර බුදු සමය බැහැර කරනු ලබන්නේ,
1. අත්ථි සුඛය යි 2. භෝග සුඛය යි 3. අණන සුඛය යි
4. කාමසුඛල්ලිකානු යෝගය යි 5. සාමිස සුඛය යි

(39) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සුඛය යන්න විවිධ අර්ථයෙන් විග්‍රහ කර ඇත. ගිහි සැප, පැවිදි සැප, සාමිස සැප, නිරාමිස සැප ආදී ලෙස ඒ බව දැකිය හැකිය. පැවිදි පක්ෂය, ලෞකික අපේක්ෂාවෙන් තොරව විඳින සුඛය නිරාමිස සුඛයයි. ගිහි ජීවිතයක් සාර්ථකව ගත කිරීමට අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ, අනවජ්ජ සුඛ යන සිව්වැදෑරුම් සැප උදව් වන බව දහමෙහි දක්වේ. මෙම සැප අතුරෙන් අණන සුඛය යන්නෙහි අදහස වන්නේ,
1. ධාර්මිකව උපයාගත් සම්පත් අර්ථවත්ව වැය කරමින් මැනවින් පරිභෝජනය කිරීමයි
2. ධාර්මිකව ධනය උපයමින් කිසිවෙකුටත් ණය නොවී ජීවත් වීමයි
3. ධාර්මිකව ධනය උපයමින් පරිභෝග නොකොට රැස්කිරීමෙන් ලබන සතුටයි.
4. දැහැමින් උපයාගත් ධනට දූදරුවන්ට ලබාදීමෙන් ලබන සතුටයි.
5. භෞතික සම්පත් මනාලෙස පරිහරණය කරමින් ලබන සතුටයි.

(40) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සදිසා නමස්කාරයට අනුව හෙට්ඨිම දිසාව නියෝජනය කරන සමාජ කණ්ඩායම වන්නේ,
1. දෙමාපියන් හා දරුවන්ය 2. ගුරුවරුන් හා සිසුන්ය 3. ස්වාමිවරු හා භාර්යාවන්ය
4. ස්වාමිවරු හා සේවකයන්ය 5. පැවිදි උතුමෝ හා ගිහියන්ය

(41) ධනය කළමනාකරණය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව සිගාලෝවාද සූත්‍රයේ පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව උපයන ලද ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් පරිභෝජනය සඳහාත්, කොටස් දෙකක් ආයෝජනය සඳහාත් හතරවන කොටස හදිසි ආපදාවකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා තැන්පත් කිරීමටත් මග පෙන්වා ඇත. මෙම උපදේශයට අනුව සමාජ යුතුකම් ඉටුකිරීමටත් දෙමාපියන් පෝෂණය කිරීම සඳහාත්, දාන මානාදිය සඳහාත් යෙදවිය යුත්තේ,
1. දෛනික පරිභෝජනය සඳහා වෙන් කළ කොටසිනි
2. ආයෝජනය සඳහා වෙන්කරන ලද කොටස් දෙකෙනි
3. ආපදාවකදී ප්‍රයෝජනය සඳහා වෙන් කළ කොටසිනි
4. මෙම සියලු කෙටස්වලින් කොටසකි
5. අමතර ආදායම් වලිනි

(42) බුදුරජාණන් වහන්සේ විසින් එක්තරා දෙවියකුගේ ආරාධනයෙන් සැවැත්නුවර ජේතවනාරාමයේදී මහා මංගල සූත්‍රය දේශනා කරන ලදී. එහි සඳහන් මංගල කරුණු අතරින් "අත්ත සම්මා පනීධීච" යන්නෙන් අදහස් කරන්නේ,
1. පණ්ඩිතයන් ඇසුරු කිරීමයි 2. තිදොර මනාව හක්මවීමයි 3. පාපයෙන් වැළකීමයි
4. කළගුණ දන්නා බවයි 5. සිත මනා සේ පිහිටුවා ගැනීමයි

(43) බෞද්ධයාගේ අත්පොත, පටිපදාමාර්ගය, ධර්ම මාර්ගය යන නම්වලින් හැඳින්වෙන ධම්මපදය සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතය ආලෝකමත් කිරීමට සමත් උපදේශ සංග්‍රහයකි. බුදුරජාණන් වහන්සේ විසින් විවිධ අවස්ථාවල දේශනාකරන ලද ගාථා ...................... එහි ඇතුළත්ය.
1. 318 ක් 2. 320 ක් 3. 420 ක් 4. 423 ක් 5. 523 ක්

(44) ආධ්‍යාත්මික හා ආර්ථික අංශවලින් පුද්ගලයා පිරිහීමට හේතුවන කරුණු හයක් භෝගවිනාශ මුඛ නමින් සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් කර ඇත. එම කරුණුවලට අයත් නොවන කරුණක් වන්නේ,
1. රහමෙර පානය 2. නොකල්හි වීථි සංචාරය 3. දූකෙළියෙහි යෙදීම
4. පාපමිත්‍ර සේවනය 5. ස්ත්‍රී ධූර්තබව

(45) "අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුයි. තමාම කළ නොකළ දේ සෙවිය යුතුය" යන අදහස දෙන ධම්මපද ගාථාවෙහි මුල් පදය වන්නේ,

1. අප්පමාදේන මඝවා ......... 2. උට්ඨානවතෝ සතිමතෝ ......... 3. නභජේ පාපකේ මිත්තේ
4. නිධීනංව පවත්තාරං 5. නපරේසං විලෝමානි

(46) බුදු සමයේ සංවර්ධනය හා ව්‍යාප්තිය සඳහා බොහෝ රජවරු විවිධ අයුරින් අනුග්‍රහය දක්වා ඇත. ඒ අතර උපදේශන ශාස්ත්‍ර විනය භාෂා ශාස්ත්‍ර නමින් ග්‍රන්ථ සම්පාදනය කර ඒවා තඹපත් වල ලියා ශෛලමය මංජුසාවක බහා එය නිදන් කිරීම සඳහා මහා සෑයක් ඉදි කරන ලද්දේ,

1. ධර්මාශෝක රජු විසිනි 2. කුමාර ගුප්ත රජු විසිනි 3. බුද්ධ ගුප්ත රජු විසිනි
4. කණිෂ්ක රජු විසිනි 5. දුටුගැමුණු රජතුමා විසිනි

(47) ප්‍රාග් බෞද්ධ ලංකාවේ විවිධ ඇදහිලි හා විශ්වාස පැවති බවට බොහෝ සාධක ඇත. ඒ අතර බොහෝ දෙවිවරු ජනතා ගෞරවයට ලක් විය. එසේ ගෞරව ලැබූ දෙවියන් අතර ................. දෙවියන් දඩයම්කරුවන්ගේ අධිපති ලෙස සලකා ඇත්තේ,

1. උපුල්වන් 2. සුමනසමන් 3. පුරදේව 4. කම්මාර 5. ව්‍යාධ

(48) ජපානයේ බෞද්ධ ජනයා විසින් විවිධ උත්සව පවත්වනු ලබයි. ඒ අතර සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිහිකිරීමේ උත්සවය ........ නමින් හඳුන්වයි.

1. ජොදෝ ඒ 2. නෙහන් ඒ 3. බොන් 4. හනමත්සුරි 5. සෙත්සුබුන්

(49) බුද්ධ ප්‍රතිමවල අත් සහ ඇඟිලි උපයෝගී කර ගනිමින් සිදු කරන සන්නිවේදන ක්‍රියාවලිය මුද්‍රා නමින් හඳුන්වයි. එවැනි මුද්‍රා වර්ග කිහිපයක්ම දැකිය හැකි අතර පොළොන්නරුවේ ගල් විහාරයේ හිටි පිළිමයේ මුද්‍රාව "පරදුක්ඛ දුක්ඛිත" මුද්‍රාව ලෙස සඳහන් කළේ,

1. කඹුරුපිටියේ වනරතන මහනාහිමියන් ය 2. විනී විතාරණ මහතා ය 3. ඩී. ටී. දේවේන්ද්‍ර මහතා ය
4. සෙනරත් පරණවිතාන මහතා ය 5. විලියම් ඊ වෝඩ් මහතා ය

(50) පොළොන්නරු යුගයට අයත් විශාලතම මෙන්ම ඉතා ප්‍රසිද්ධියට පත් චිත්‍රාවලියක් දැකිය හැකි ස්ථානයක් වන්නේ,

1. තිවංක පිළිම ගෙය යි 2. මැද්දෙපොල විහාරය යි 3. මාවිල සුමන කුසුමාරාමය යි
4. මැදවල විහාරය යි 5. හිඳගල විහාරය යි

සියලුම හිමිකම් ඇවිරිණි.

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Southern Provincial Department of Education**

අ. පො. ස. (උසස් පෙළ) - තෙවන වාර පරීක්ෂණය - 2021
**G. C. E. (Adv. Level) - Second Term Test - 2021**

| | | | | |
|---|---|---|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය - II<br>Buddhist Civilization - II | 45 S II | 13 ශ්‍රේණිය | කාලය පැය 03 යි.<br>Two hours<br>අමතර කියවීම් කාලය<br>මි. 10 |

උපදෙස්:-

- I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

මෙම කොටසින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(1) i බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 02 යි)
ii බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙන හැර දක්වන්න. (ලකුණු 03 යි)
iii කාන්තාව මවක් ලෙස බුදුසමයෙන් අගය කළ බවට සාධක හතරක් දක්වන්න. (ලකුණු 04 යි)
iv බුද්ධ කාලීන භාරතයේ මගධ රාජ්‍යය පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)
v පූර්ණ කස්සප ශාස්තෘවරයාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න. (ලකුණු 06 යි)

(2) i නව අරහාදී බුදු ගුණවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
ii බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යාඥාන නම් කරන්න. (ලකුණු 03 යි)
iii බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ප්‍රකට කළ අවස්ථා හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)
iv සැරියුත් මහරහතන් වහන්සේගේ චරිත ලක්ෂණ තුළින් ගත හැකි ආදර්ශ හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
v බුදුරජාණන් වහන්සේ තුළ පැවති පද්මාකාර ජීවිතය පහදන්න. (ලකුණු 06 යි)

(3) i උට්ඨානවතෝ සතිමතෝ ..... යනාදී ධම්ම පද ගාථාව නිවැරදිව ලියන්න. (ලකුණු 02 යි)
ii එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03 යි)
iii සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුසිසු යුතුකම් ලියා දක්වන්න. (ලකුණු 04 යි)
iv මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු පහක් කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)
v පුද්ගල හා සමාජ පරිහානියට හේතුවන කරුණු හයක් පරාභව සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## II කොටස

(4) i බෞද්ධ දේශපාලන මූලධර්ම සකස් වී ඇත්තේ ජනහිතකාමී පාලන තන්ත්‍රයක් සකස් කිරීමේ අරමුණින් බව සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)
ii පුද්ගලයාගේ මෙලොව පරලොව හිතසුව සඳහා දසකුසල් යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(5) i අල්පේච්ඡතාවයෙහි ඇති කාලීන වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)
ii ශ්‍රද්ධාව පිළිබඳව විමසීමක් කර බෞද්ධ විමුක්ති මාර්ගය සඳහා එය ඉවහල්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(6) i බුද්ධ කාලීන ධර්ම ප්‍රචාරක සේවාවේ සාර්ථකත්වය සඳහා බලපාන ලද සාධක විමර්ශනය කරන්න. (ලකුණු 10 යි)
ii තෙවන ධර්ම සංගායනාවේ පසුබිම හඳුන්වා බුදු සසුනේ චිරස්ථිතිය සඳහා එහි ප්‍රතිඵල බලපෑ ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 යි)

(7) i ධන සම්පත් පරිහරණය කෙසේ කළ යුතුදැයි බෞද්ධ මූලාශ්‍ර ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)
ii ධාර්මික ජීවිකාවක් සඳහා ශ්‍රමයෙහි ඇති උපයෝගීතාවය පහදන්න. (ලකුණු 10 යි)

(8) i තායිලන්තයට බුදු සමය හඳුන්වා දීම පිළිබඳ තොරතුරු කෙටියෙන් ගෙන හැර දක්වා එරට සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)
ii ශ්‍රී ලංකාවේ ස්තූප කලාවේ ආරම්භය හා ව්‍යාප්තිය හඳුන්වා එහි ආගමික අනන්‍යතාවය තහවුරු වූ ආකාරය පහදන්න. (ලකුණු 10 යි)